@ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1686/50 - 2011 ජනවාරි 01 වැනි සෙනසුරාදා - 2011.01.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.—බී 10/2009

**විනිමය පාලන පනත (423 වැනි අධිකාරිය)**

**17 වැනි වගන්තිය යටතේ නියමය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව සමග කියවිය යුතු (423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වැනි වගන්තියේ (1) වැනි සහ (2) වැනි උපවගන්ති යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මේ නියමයෙන් —

(1) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්ට සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් සමාගමකට හෝ ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති හවුල් ව්‍යාපාරයකට පහත (3) වැනි ඡේදයේ දක්වා ඇති විධාන සහ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් යම් විධානයකට යටත්ව, විදේශීය සමාගම්වල කොටස් සහ ශ්‍රී ලංකාවේ තත්කාලයේ පවතින ණය ශ්‍රේණිගත කිරීම් ශ්‍රේණියක හෝ ඊට ඉහළ ශ්‍රේණියක ශ්‍රේණිගත කර ඇති, විදේශීය රජයන් හා රාජ්‍ය සංවිධාන විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කර අත් කරගැනීමට, දැරීමට සහ පැවරීමට අවසරය ප්‍රදානය කරමි.

එසේ වුව ද, ඉහත ප්‍රදානය කරන ලද අවසරය —

(i) 2007 අංක 7 දරන සමාගම් පනතේ අර්ථානුකූලව ඇපයෙන් සීමිත යම් සමාගමක් ;

(ii) යම් රාජ්‍ය නොවන සංවිධානයක් ;

(iii) විනිමය පාලන පනත යටතේ කරන ලද චෝදනාවක් සම්බන්ධයෙන් නීති කෘත්‍යයක් පවත්වාගෙන යනු ලබන්නේ යම් තැනැත්තෙකුට, සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට එරෙහිව ද, එවැනි තැනැත්තෙකු, සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක්

සම්බන්ධයෙන් අදාළ නොවේ.

(2) ඉහත (1) වැනි ඡේදයේ සඳහන් සෑම තැනැත්තෙකු ම, සමාගමක් ම හෝ හවුල් ව්‍යාපාරයක් ම විසින්—

(i) ඉහත (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් කාර්යය සඳහා කෙරෙන සියලු ප්‍රතිමුඛ ප්‍රේෂණ විනිමය පාලකවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුව බලපත්‍රලත් වාණිජ බැංකුවක විවෘත කරනු ලබන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් මගින් පමණක් සිදු කළ යුතු බවට ද ;

(ii) විදේශීය සමාගමක ලාභාංශ, ප්‍රාග්ධන ඉපැයුම් හා කොටස් විකිණීමෙන්, ඈවර කිරීමෙන් හෝ ප්‍රාග්ධනය අඩු කිරීමෙන් ලැබිය යුතු ආදායම් සහ යම් ප්‍රාග්ධන ඉපැයීමක් තිබේ නම් එය ද ඇතුළුව, ස්වෛරීත්ව බැඳුම්කර විකිණීමෙන් හෝ කල්පිරීමෙන් ලැබිය යුතු ආදායම්, ස්වෛරීත්ව බැඳුම්කර මත ඉපැයූ පොළිය ද සමඟ මූලික ආයෝජනය සිදුකළ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට බැර වනසේ එකී ගෙවීම් ලැබූ දිනයේ සිට මාස තුනක් ඇතුළත ශ්‍රී ලංකාවට දේශප්‍රත්‍යාවර්තනය කළ යුතු බවට ද ;

(iii) අදාළ නිර්දේශය නිකුත් කරන අවස්ථාව වන විට වෘත්තියේ නියැලීමට වලංගු සහතිකයක් හිමි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකුගෙන් ලබාගත් නිර්දේශයක් සමග බලයලත් වෙළෙන්දෙකු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු බවට ද ;

(iv) ඉහත (iii) වැනි අනුඡේදයේ සඳහන් කළ සෑම ඉල්ලීමක් ම, එම ආයෝජනය සඳහා ම වෙනත් බලයලත් වෙළෙන්දෙකු හරහා ප්‍රතිමුඛ ප්‍රේෂණයක් නොකළ බවට සහ ශ්‍රී ලංකාවෙන් විගමනය කිරීම සඳහා විදේශ විනිමය ලබා ගැනීමට අයදුම්පතක් ඉදිරිපත් කර නොමැති බවට සඳහන් දිවුරුම් පෙත්සමක් සමග ඉදිරිපත් කළ යුතු බවට ද ;

(v) (3) වැනි ඡේදය යටතේ දක්වා ඇති සීමාවන් ඉක්මවා ආයෝජනය කිරීමේ දී ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු බවට ද ;

(vi) විනිමය පාලකවරයා විසින් බලයලත් වෙළෙන්දා වෙත නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව බලයලත් වෙළෙන්දා විසින් නියම කරන ලද ලේඛන හා තොරතුරු බලයලත් වෙළෙන්දා වෙත ඉදිරිපත් කළ යුතු බවට ද

විධාන කරමි.

(3) යම් තැනැත්තෙකුට, සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට (1) වැනි ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසරය පහත සඳහන් සීමා කිරීම්වලට යටත් වන බව නිශ්චිතව සඳහන් කරමි :—

(i) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත සමාගමක් සම්බන්ධයෙන් වසරකට ඇමරිකන් ඩොලර් ලක්ෂ පහක් ($ 500,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ;

(ii) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත නොකළ සමාගමක් සම්බන්ධයෙන් වසරකට ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක් ($ 100,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ;

(iii) ප්‍රේෂණය කිරීමට අපේක්ෂිත මුදල ආවරණය වන පරිදි බදු නිෂ්කාශන සහතිකයක් එක් එක් හවුල්කරු විසින් බලයලත් වෙළෙන්දාට ඉදිරිපත් කිරීමට යටත් ව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක් ($ 100,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ;

(iv) ප්‍රේෂණය කිරීමට අපේක්ෂිත මුදල ආවරණය වන පරිදි බදු නිෂ්කාශන සහතිකයක් බලයලත් වෙළෙන්දාට ඉදිරිපත් කිරීමට යටත් ව, ශ්‍රී ලංකාවේ නේවාසික තනි පුද්ගලයකු සම්බන්ධයෙන් ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක් ($ 100,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ;

(v) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ සමාගමක ශ්‍රී ලංකාවේ ශාඛාවක හෝ පාලිත සමාගමක සේවා නියුක්තයන් විසින් සේවා නියුක්තයන්ගේ කොටස් මනාප යෝජනා ක්‍රමයක් යටතේ එම සමාගමේ කොටස් අත්කර ගැනීම සඳහා, එක් සේවා නියුක්තිකයෙකුට ඇමරිකන් ඩොලර් ලක්ෂ එකක් ($ 100,000) හෝ ඊට සමාන වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ;

එසේ වුව ද, ශ්‍රී ලංකාවේ ශාඛාවේ හෝ පාලිත සමාගමේ සියලු ම සේවා නියුක්තයන් විසින් අත්කරගනු ලබන කොටස් සංඛ්‍යාව, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ සමාගම නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාවේ වටිනාකමෙන් සියයට පහක (5%) ප්‍රතිශතය නොඉක්මවිය යුතු ය.

(4) තවදුරටත් —

(i) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කළ සමාගම්වල ප්‍රසාද කොටස් නිකුතු යටතේ සහ සංචිත ප්‍රාග්ධනීකරණය මගින් ලබාගත් කොටස්, මේ නියමයට අනුව අත්කර ගනු ලැබූ කොටස් ලෙස සලකනු ලැබිය යුතු බව ; සහ

(ii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ අර්ථානුකූලව ව්‍යවසායන්ට, දැනටත් ප්‍රදානය කරනු ලැබ ඇති නිදහස් කිරීම්වලට පමණක් අදාළව, මේ නියමයේ ඇතුළත් කිසිවකින් බලපෑමක් හෝ බැඳීමක් ඇතිවන්නේ යයි කියවා තේරුම් නොගත යුතු බව

ප්‍රකාශ කරමි.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ නියමයේ කාර්යය සඳහා —

"විනිමය පාලන පනත" යන්නෙන් (423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ ;

"විදේශ ව්‍යවහාර මුදල්" යන්නට (423 වැනි අධිකාරය වූ) විනිමය පාලන පනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"බලපත්‍රලත් වාණිජ බැංකුව" යන්නෙන්, බලපත්‍රලත් වාණිජ බැංකුවක් ලෙස ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සමාගමක් හෝ ආයතනයක් අදහස් වේ ;

"ශ්‍රී ලංකාවේ නේවාසික" යන්නට, විනිමය පාලන පනත යටතේ 1972 අප්‍රේල් මස 21 වැනි දින අංක 15007 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විධානයෙහි ඒ යෙදුමට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"පාලිත සමාගම" යන්නට, 2007 අංක 7 දරන සමාගම් පනතේ දී ඇති අර්ථය ම ඇත්තේ ය.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

01-314

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.